# <u>සරණාගතයෙකු ලෙස පිළිගැනීම සඳහා ඉල්ලුම් කිරීම මගින් ඔබට ජපානයේ රැකියා කළ හැකි වේ යයි අදහස් නොවේ</u>

2019 මාර්තු

අධිකරණ අමාත්‍යාංශය ආගමන හා විගමන කාර්යාංශය

ජපානයේ රැඳී සිටින අතරතුර සරණාගතයෙකු ලෙස පිළිගැනීම සඳහා ඉල්ලුම් කිරීම මගින් රැඳී සිටීමේ සුදුසුකම් තත්වය වෙනස් කර ගන්නා කෙටි කාලයකට පැමිණෙන  ආගන්තුකයන් ("කෙටි කාලීන රැඳී සිටීම") සඳහා විශේෂයෙන් ම මෙම නිවේදනය නිකුත් කෙරේ. සරණාගතයෙකු ලෙස පිළිගැනීම යනු, පීඩාවන්ගෙන් බේරී ජපානයට පැමිණි සරණාගතයන් ජපානයෙන් ආරක්ෂාව ඉල්ලා සිටීම සඳහා වූ ජපානයේ ඇති  ක්‍රමවේදයක් වන අතර, ජපානයේ රැකියා බලාපොරොත්තු වන අය සඳහා වූ ක්‍රමවේදයක් නොවේ.

2018 ජනවාරි 14 ට පෙර, සරණාගතයෙකු ලෙස පිළිගැනීමට ඉල්ලුම් කල පුද්ගලයන් සඳහා, ඉල්ලුම් කල දින සිට 6 මසක් ගත වූ පසු, සාමාන්‍යයෙන් රැකියා සඳහා අවසරය ලැබුණි. නමුත්, අධිකරණ අමාත්‍යාංශය ආගමන හා විගමන කාර්යාංශය, 2018 ජනවාරි 15 දින, මෙම ක්‍රමය නැවත සලකා බැලූ අතර, 1951 වසරේ සරණාගත ගිවිසුමට අනුව සරණාගතයන් ලෙස පැහැදිලිව නොපෙනෙන ඉල්ලුම් කරුවන් සඳහා, සරණාගතයෙකු ලෙස පිළිගැනීම සඳහා දැනටමත් ඉල්ලුම් කර ඇති අවස්ථාවක වුව ද, ජපානයේ රැඳී සිටීමට හෝ රැකියා කිරීමට අවසර නොලැබේ. එවැනි ඉල්ලුම් කරුවන් සඳහා, (නීත්‍යානුකූලව) රැඳී සිටීමේ කාලය අවසන් වූ පසුව, ජපානයෙන් පිටුවහල් කිරීමේ ක්‍රමවේද (බලහත්කාරයෙන් පිටුවහල් කිරීම ද ඇතුළත් ව) අනුගමනය කෙරේ.